# දැන්වීම් පුරප්පාඩු

## සී/ස ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතිය

## අනුරාධපුර පාර - ගල්ගමුව

**සී/ස ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ගල්ගමුව / ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.)**

| අ.අ. | තනතුර | වැටුප් සංකේත | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | |
|---|---|---|---|---|---|
| | | | | බාහිර බඳවා ගැනීම් (විවෘත) | අභ්‍යන්තර බඳවා ගැනීම් (සීමිත) |
| 01 | කළමනාකරු මානව සම්පත් සංවර්ධන | TSL | 28700/-<br>450X10<br>525X11<br>625X10<br>45225/- | අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය විෂය සහිතව, කළමණාකරනය පිළිබඳව උපාධියක් ලබා තිබීම සමග මානව සංවර්ධන ක්ෂේත්‍රයට අදාල තනතුරක වසර 01 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ<br>ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමණාකරනය පිළිබඳව ඩිප්ලෝමාවක් සමත් වීම හෝ සමග මානව සම්පත් ක්ෂේත්‍රයට අදාල වසර 04 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම | අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ධාරාවක් යටතේ උපාධියක් ලබා තිබීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ<br>ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණය හෝ ප්‍රජා සංවර්ධනය හෝ පිළිබඳව ඩිප්ලෝමාවක් සමත් වීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ<br>ඇ) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) පාඨමාලාව විෂයන් 03 කට සම්මාන සහිතව සියලු විෂයන්ගේ සමත් වීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 15 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම |
| 02 | අභ්‍යන්තර විගණක (ග්‍රාමීය බැංකු) | TSL | 28700/-<br>450X10<br>525X11<br>625X10<br>45225/- | අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වානිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව විෂය සහිතව හෝ ගිණුම්කරණය හෝ ගණකාධිකරණ විෂයය ධාරාවෙන් හෝ උපාධියක් ලබා තිබීම සමග රැකියා ක්ෂේත්‍රයට අදාලව අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 01 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා කිරීම.<br>හෝ<br>ආ) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත්වීම සමග රැකියා ක්ෂේත්‍රයට අදාලව අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 02 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) අන්තර් මධ්‍ය සහතිකය (Business Level) ලබා තිබීම හෝ ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අදියර III සමත්වීම හෝ සමග රැකියා ක්ෂේත්‍රයට අදාලව අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වානිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව විෂය සහිතව හෝ ගිණුම්කරණය හෝ ගණකාධිකරණ විෂයය ධාරාවෙන් හෝ උපාධියක් ලබා තිබීම සමග සමුපකාර ව්‍යාපාරයේ රැකියා ක්ෂේත්‍රයට අදාලව අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 01 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>ආ) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත්වීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 02 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) අන්තර් මධ්‍ය සහතිකය (Business Level) ලබා තිබීම හෝ ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අදියර III සමත්වීම හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු හා මූල්‍ය හෝ ගිණුම් / විගණනයේ හෝ බැංකු කළමනාකරණය හෝ පිළිබඳව ඩිප්ලෝමාවක් සමත්වීම හෝ සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>ඈ) අ. පො.ස. උසස් පෙළ වානිජ විෂය ධාරාවෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් 3 කින් එකවර සමත් වීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 06කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>ඉ) OL වැටුප් පරිමාණයේ විගණන සහකාර තනතුරේ 1 වන ශ්‍රේණියේ වසර 05 කට නොඅඩු සතුටු දායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 03 | ප්‍රාදේශික අලෙවි කළමනාකරු | OL | 21500/-<br>270X10<br>320X11<br>375X10<br>31470/- | අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ විෂයය ඇතුළුව විෂයන් 03 කට සම්මාන සහිතව ගණිතය විෂය ද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම. | ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සා/පෙළ) පාඨමාලාව සමත්වීම සමග MSSL (T) වැටුප් පරිමාණයේ හෝ MSSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>ඉ) MSSL වැටුප් පරිමාණයේ වෙළඳ සහකාර තනතුරේ වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

1. ඉහත තනතුරු ස්ථිර තනතුරු වේ. විශ්‍රාම වැටුප් සහිත සේවක අර්ථසාධක අරමුදලට , සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇති තනතුරු වන අතර, සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් වරින් වර ලබාදෙන දීමනා සඳහා හිමිකම් ඇත.

2. මෙම බඳවා ගැනීම් වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 3/2020 වැටුප් හා බඳවා ගැනීමේ චක්‍රලේඛයට අනුකූල වේ.

**බඳවා ගැනීමට අදාළ වෙනත් සුදුසුකම්**

- සියලුම අයදුම්කරුවන් ගල්ගමුව / ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විය යුතුයි.
- මේ සඳහා ඉහත සුදුසුකම් සපුරා ඇති වයස අවුරුදු 18 ත් 45 ත් අතර ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයටම අයදුම්පත් ඉදිරිපත් කළ හැක. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.)
- විධිමත් අයදුම් කිරීමේ අයදුම්පත්‍ර රාජකාරී දිනවලදී පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා සමිතියේ ලේකම් තැනගෙන් ලබාගත යුතුය.

  (එක් අයදුම් පත්‍ර ආකෘතියක් සඳහා රු. 50.00 ක මුද්‍රණ වියදමක් අයකරන බව කාරුණිකව දන්වා සිටිමු.)
- අයදුම්පත උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ග්‍රාම නිළධාරී සහතිකය, සියලුම අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් හා අනෙකුත් සහතිකවල ඡායා පිටපත්ද සමග අමුණා ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට එවිය යුතුයි.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025.09.12 දිනය වේ. මෙම දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය.

**සැ.යු. වසර 05 ක සේවා ගිවිසුම් කොන්දේසි වලට යටත්ව සේවා කළ යුතුය.**

**සභාපති, සී/ස ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතිය,
අනුරාධපුර පාර, ගල්ගමුව.**

**විමසීම් - 037-2253008**